(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 251.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2018 අප්‍රේල් මස 04 වැනි බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

465/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (10)

(අ) (i) 2015 වසර තුළ ජනාධිපතිතුමා සහභාගී වූ විදේශ සංචාර කවරේද;

(ii) එකී එක් එක් විදේශ සංචාරයට සහභාගී වූ පුද්ගලයන්ගේ නම්, තනතුරු සහ එම පුද්ගලයන් වෙනුවෙන් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන විසින් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1231/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1424/'16

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 201 මගින් පුත්තලම, හම්බන්තොට සහ කිලිනොච්චිය වැනි විශේෂයෙන් හඳුනාගත් ප්‍රදේශවල විශාල වශයෙන් පරිසර සංවේදී කර්මාන්ත පිහිටුවන බවට කර ඇති යෝජනාවට අනුව 2016 වර්ෂයේදී එම ප්‍රදේශවල අලුතින් පිහිටවනු ලැබූ කර්මාන්ත කවරේද;

(ii) පරිසර සංවේදී කර්මාන්ත හඳුනාගැනීම සඳහා භාවිතා කරන දර්ශකයන් කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ අපනයන සැකසුම් කලාප තුළ සහ ඉන් පිටත ස්ථානගත කර ඇති පරිසර සංවේදී කර්මාන්ත කවරේද;

(iv) උක්ත කර්මාන්ත මඟින් පරිසරයට ඇතිවන අහිතකර බලපෑම් වැළැක්වීම සඳහා රජය විසින් නිර්දේශිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1739/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹදිව වන්දනා ගමන් සංවිධානය කිරීමට අවසර ලත් ආයතන හා පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් හා පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා දඹදිව වන්දනා ගමන්වලදී මියගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම මියගිය පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) එම පුද්ගලයන් දඹදිව රැගෙන ගිය ආයතන කවරේද;

(vi) එසේ මියගිය පුද්ගලයන්ගේ පවුල්වල සුබසාධනය වෙනුවෙන් අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2007/'17

ගරු බිමල් රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම සංස්කෘතික අරමුදල සහ විෂයභාර අමාත්‍යවරයා අතර සම්බන්ධීකරණය සඳහා ආයතනයේ දැනට පවතින තනතුරුවලට අමතරව වෙනත් නිලධාරීන් පත්කර තිබේද;

(ii) එසේ නම්, පත්කර ඇති නිලධාරීන් සංඛ්‍යාව සහ තනතුරු කවරේද;

(iii) එම පත්වීම් ලබාදීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iv) එම පත්වීම් සඳහා සළකා බලන ලද අවම අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(v) ඔවුන්ගේ වැටුප් හා දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2116/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩුසුට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්‍රාමසේවා වසම් 27කට අයත් ගම්මාන 114ක කුඩා කෘෂිකාර්මික වැව් 45ක් පමණ තිබෙන බවත්;

(ii) ඉහත වැව් අවුරුදු ගණනාවක සිට ප්‍රතිසංස්කරණය කර නොමැති බැවින් යල කන්නයේදී වී ගොවීන් හා අනිකුත් ගොවීන්ට අදාළ කාලය තුළ වගා කටයුතුවල යෙදීමට නොහැකි වීමෙන් ඔවුන් බොහෝ පීඩාවට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැව්වලට ප්‍රමුඛත්වය ලබා දී, ඒවා ප්‍රතිසංස්කරණය කිරීමට අමාත්‍යාංශය සතුව කිසියම් වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, මෙම වැව් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2138/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව් සහ වවුනියාව දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනගත් පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 9.30 දක්වා විය යුතු ය. අ. භා. 9.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ අංක 7 දරන ස්ථාවර නියෝගයෙහි සහ අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

පා. 216/'18

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු විමල් රාජපක්ෂ මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු කනක හේරත් මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා,— අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා කෙරෙහි විශ්වාස භංගත්වය,—

බැඳුම්කර වංචාවක් සිදු කිරීමේ අරමුණින් සම්මතයට පටහැනිව ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් අමාත්‍යාංශයෙන් ඉවත් කර තමන් යටතට පත් කරවා ගත් හෙයින් ද;

ශ්‍රී ලංකා පුරවැසියෙකු නොවූ ද, අපකීර්තිමත් ඉතිහාසයක් ඇත්තා වූ ද, බැඳියාවන් අතර ගැටුමක් ඇත්තා වූ ද, අර්ජුන් මහේන්ද්‍රන් මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධූරයට යෝජනා කළ හෙයින් ද;

මෑත යුගයේ ලෝකයේ සිදු වූ දැවැන්තම මූල්‍ය වංචාව වන ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර වංචාවට ඉතා පැහැදිලි ලෙස සම්බන්ධ හෙයින් ද;

එකී වංචාවේ වංචනිකයන් බේරා ගැනීම සඳහා, තම දේශපාලන හිතවතුන්ගෙන් සමන්විත පිටිපන කමිටුව පත්කර එකී වංචනිකයන් බේරා ගැනීමට උත්සාහයක් දැරූ හෙයින්ද;

මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳ වංචනිකයන් ආරක්ෂා කරමින් ද, සැබෑ කරුණු යටපත් කරමින් ද, 2015 මාර්තු 17 දින විශේෂ ප්‍රකාශයක් කරමින් පාර්ලිමේන්තුව නොමග යැවූ හෙයින්ද;

බැඳුම්කර වංචාව පිළිබඳ පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප්) විසින් විමර්ශනය කරමින් තිබිය දී, එකී කමිටුව නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙකු වෙනස් කර නව සාමාජිකයෙකු ඇතුළු කර එකී කාරක සභාව හරහා වූදිතයන් නිදොස් කිරීමට උත්සාහයක් ගත් හෙයින්ද;

බැඳුම්කර වංචාව පිළිබඳ පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප්) විසින් විමර්ශනය කරමින් තිබිය දී ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ එකී කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන්ට බලපෑම් කළ හෙයින්ද;

මහ බැංකු බැඳුම්කර වංචාවට සම්බන්ධ බවට ඒ පිළිබඳ ජනාධිපති කොමිසමේ දී හෙළි වූ, නියෝජ්‍ය මහ බැංකු අධිපති පී. සමරසිරි මහතාට මුදල් අමාත්‍යාංශයේ උපදේශක තනතුරක් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කළ හෙයින්ද;

මහ බැංකු බැඳුම්කර වංචාවේ වූදිතයෙකු වූ අර්ජුන් මහේන්ද්‍රන් මහතා වෙනුවට වෙනත් අයෙකු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධූරයට පත් කිරීමට ජනාධිපතිවරයා කටයුතු කරන මොහොතේ දී නැවතත් ඔහුව එකී ධූරයට පත් කර ගැනීමට දැවැන්ත වෑයමක් දැරූ හෙයින්ද;

බැඳුම්කර වංචාවේ වූදිතයෙකු වීම හේතුවෙන් අර්ජුන් මහේන්ද්‍රන් මහතාට මහ බැංකු අධිපති තනතුර අහිමි වීමෙන් පසු ද ඔහුට සිය අමාත්‍යාංශයේ උපදේශක තනතුරක් ලබා දුන් හෙයින්ද;

අර්ජුන් මහේන්ද්‍රන් මහතා ශ්‍රී ලංකාවෙන් පිට වන තෙක් ඔහු විදේශගත වීම වළක්වන අධිකරණ නියෝගයක් ලබා ගැනීම මග හැරීමෙන් ඔහුට විදේශගත වී අධිකරණය මග හැර සිටීමට අවස්ථාව සැලසූ හෙයින්ද;

මුදල් අමාත්‍යවරයාට පමණක් බලතල ක්‍රියාත්මක කළ හැකි,

(i) 1949 අංක 58 දරන මූල්‍ය පනත

(ii) 1953 අංක 24 දරන විනිමය පාලන පනත

(iii) 1923 අංක 8 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් පනත

(iv) 1937 අංක 7 දරන ලියාපදිංචි කළ ස්කන්ධ සහ සුරැකුම් ආඥාපනත

(v) 1944 අංක 16 දරන මූල්‍ය සංචිත අරමුදල් ආඥාපනත

(vi) 1988 අංක 30 දරන බැංකු පනත

(vii) 1979 අංක 35 දරන අවිනිශ්චිත අරමුදල් පනත

(viii) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනත

(ix) 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත

යන අණ පනත් ඒ බව දනිමින් ම ශ්‍රී ලංකා මහ බැංකුව තමන් යටතට පත් කර ගනිමින් එකී අණ පනත් යටතේ බලතල ක්‍රියාත්මක කිරීම හේතුවෙන් රටේ ආර්ථිකය සහ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් ඉතාම වැදගත් වන්නා වූ අණ පනත් උල්ලංඝණය කළ හෙයින් ද;

ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ද, ආර්ථික කළමනාකරණ කමිටුව හරහා මුදල් අමාත්‍යාංශය ද, ශ්‍රී ලංකා මහ බැංකුව ද, තමන් යටතට ගෙන පසුගිය තෙවසර තුළ ජාතික ආර්ථිකය මෙහෙයවීමේ ප්‍රතිඵලයක් ලෙස ආර්ථික වර්ධනය අඩපණ වීමෙන් ද, කොටස් වෙළඳපොල කඩා වැටීමෙන් ද, උද්ධමනය පාලනය කළ නොහැකි අයුරින් ඉහළ යෑමෙන් ද, පොලී අනුපාතය සීඝ්‍ර වර්ධනයට ලක් වීමෙන් ද, විදේශීය ආයෝජකයන් ආයෝජන හකුලාගෙන ශ්‍රී ලංකාවෙන් ඉවත් වීමෙන් ද දැවැන්ත ආර්ථික අර්බුදයක් නිර්මාණය කර ජනතාව පීඩාවට පත්කර ඇති හෙයින් ද; සහ

නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යධූරය දරමින් සිටි කාලය තුළ මහනුවර දිස්ත්‍රික්කය තුළ ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය හමුවේ සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාවට ආරක්ෂාව සැලසීමට ක්ෂණික පියවර ගැනීමට අසමත්වීමෙන් ජීවිත සහ දේපළ හානි සිදු වීමෙන් ජාතික සමගිය බරපතළ ලෙස පළුදු කරමින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය කැළැල් කළ හෙයින් ද;

අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතාට තවදුරටත් අග්‍රාමාත්‍යවරයා ලෙස ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස ද, කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව මෙන්ම එතුමා අග්‍රාමාත්‍ය ධූරය දරන ආණ්ඩුවට කටයුතු කිරීමේ හැකියාව පිළිබඳවද විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

*2.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1),— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 8, 14 සහ 30 වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ මෝටර් වාහන (ගාස්තු) නියෝග සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 15 දිනැති අංක 2054/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2),— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 143 වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ මෝටර් වාහන (අධිවේගී මහාමාර්ග) නියෝග සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 15 දිනැති අංක 2054/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*4.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 3),— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 215අ වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ස්ථානීය දඬ නියෝග සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 15 දිනැති අංක 2054/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*5.

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත — කාරක සභාව.

*7.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සුරැකුම්පත් විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 11 දිනැති අංක 2049/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1004 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 1),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජූනි 16 දිනැති අංක 1867/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය සංශෝධනය කරමින් 2017 දෙසැම්බර් 29 දිනැති අංක 2051/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 2),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 16 දිනැති අංක 2062/47 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 2017 දෙසැම්බර් 15 දිනැති අංක 2049/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව,— 2017 අංක 17 දරන පනතින් සංශෝධිත 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 3අ. (11) වගන්තිය ප්‍රකාරව සීමා නිර්ණය කමිටුව විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදුව 2018.03.06 දින පාර්ලිමේන්තුවේදී සභාගත කරන ලද එකී කමිටුවේ වාර්තාව අනුමත කළ යුතු ය.

*14.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව 2015.11.27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා විගණකාධිපතිවරයා වශයෙන් පත්කර ඇති හෙයින්ද;

විගණකාධිපතිවරයාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2017.11.14 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතාට පහත පරිදි වැටුප් හා දීමනා ගෙවීමට අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) 2015.11.27 වැනි දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව SL - 4 වැටුප් පරිමාණයේ 08 වැනි වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම හා තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමට;

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව 2016.01.01 වැනි දින සිට වැටුප පරිවර්තනය කිරීමේ දී SL – 4 වැටුප් ක්‍රමය යටතේ එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි වැටුප් පරිවර්තනය කර ගෙවීමට; සහ

(ඇ) එකී වැටුප් පරිමාණයට අදාළ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*15.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදන ලද, 2017 දෙසැම්බර් 04 දිනැති අංක 2048/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු, මාධ්‍ය උපමාන අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

20.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

21.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

22.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

23.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

24.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

25.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

26

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

27.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

28.

ද ඉන්ස්ටිට්යුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**